# හිතුවක්කාර හා පැංචාට හොඳ පාඩමක්



මෙත්නා සඳහම්කි දිසානායක

# හිතුවක්කාර හා පැංචාට හොද පාඩමක්.


## මෙත්නා සඳහම්කි දිසානායක

කතෘ


කතෘගේ වෙනත් කෘති

ගමරාළට හොඳ පාඩමක්


මහාමායා බාලිකා විද්‍යාලය,

මහනුවර.

6-B ශ්‍රේණිය



ISBN : 978-624-208-993-5

10.05.2026

# පිදුම

මට මේ පොත ලියා නිම කිරීමට,
මාව දිරිමත් කළ මගේ සෙවණැල්ල වගේ
මා පිටුපස සිටින අම්මාටත්, තාත්තාටත්,
මහාමායා විදුමව් සෙවණේ.
මට සිප්සතර කියාදෙන
මගේ පන්තිභාර
ගුරුමෑණියන්ටත්,
ඒවගේම
මගේ ආදරණීය
අයියලා දෙන්නාටත්
මගේ මේ පොත
ආදරයෙන් පුදමි.



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,

ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.

සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා භාරිකාව විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු   දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.


ප්‍රදීප් නිලංග දෑල,

දියවඩන නිලමේ,

ශ්‍රී දළදා මාලිගාව

2026.05.10

# හිතුවක්කාර හා පැංචාට හොඳ පාඩමක්.

එකමත් එක ලස්සන කැලෑවක හා අම්මා කෙනෙකුයි හා තාත්තා කෙනෙකුයි පුංචි හා පුතෙකුයි හරිම සතුටෙන් ජීවත් වුණා. හා තාත්තා හැමදාම උදේම කැලෑවට යනවා හා අම්මාටයි පුංචි හා පුතාටයි කෑම හොයන්න.

මේ පුංචි හා පුතා හරිම දඟයි. එයා අම්මාට පොඩ්ඩක් වත් කීකරු උණේ නැහැ.

"සුදු පුතේ ....... සුදු පුතේ....... කෝ මේ ළමයා කොහෙට උණාද?"

හා අම්මා හැම තිස්සෙම හා පුතාට අඬ ගහනවා.

හා පුතා නිතරම යන්නේ කැලේ පහල තියන ගඟ ළඟට.



එතනට එයාගේ යාළුවෝ කිහිප දෙනෙක්ම එනවා සෙල්ලම් කරන්න.

ඊත් හා අම්මා බයයි සුදු පුතා ගඟට වැටෙයි කියල.

හා අම්මා කෑ ගසමින් ගඟ දෙසට ගියා. අම්මා යන කොට සුදු පුතා එයාගේ යාලුවෝ එක්ක ගඟට කෝටු වලින් ඇන ඇන හිටියා.

"සුදු පුතේ.......සුදු පුතේ......මොකද ළමයෝ ඔය කරන්නේ. බලන්න ඊයේ රෑ වැහැලා ගඟ හොඳටම පිරිලා සැරට වතුර යනවා."

කියමින් හා අම්මා නොයිවසිල්ලෙන් හා පුතා ලඟට ඇවිත් පුතාව ඇදල පැත්තකට ගත්තා.

ඒ අතර රිළා පැංචා, අලි පැංචා, වලස් පැංචා, ගිරා පැංචා ත් හිටියා.



"අනේ දරුවනේ ඔය වැඩේ කරන්න එපා. ඒක හරිම අවදානම්. හැමෝම යන්න ගෙවල් වලට. අම්මලා හොයනවා ඇති ඔයාලව ගොඩාක් බයවෙලා."

කියමින් හා අම්මා යාලුවෝ හැමෝම ගෙදර ඇරියා.

හා පැංචා හයියෙන් අඬන්න ගත්තා.

"මම තරහයි අම්ම එක්ක. ඔයා හරි නරකයි. මගේ යාළුවෝ හැමෝම මාව දාල ගියා."

කියමින් හා පැංචා බිම පෙරළෙමින් අඬන්න ගත්තා.

"මගේ සුදු පුතා අපි යමු. ගෙදර ඔයාට මම රස කෑමක් හැදුවා. කෝ එන්න ඔයාව වඩා ගන්න."



කියමින් බිම පෙරළී සිටී හා පැංචාව අම්මා ආදරෙන් වඩා ගත්තා.

" මේ අහන්න මගේ සුදු පුතේ. අපිට ඉන්නේ ඔයා විතරයි. දෙමාපියන්ට දරුවෝ ගොඩාක් වටිනවා. ගොඩාක් වටින වස්තුවකට වඩා දරුවෝ දෙමාපියන්ට වටිනවා. එතන හරිම අවදානම් තැනක්. ඔයා ඒ ගඟට වැටුණොත් ආයෙ ඔයාට ගොඩට එන්න බැරි වෙයි. ඔයා ගිලෙයි. එතකොට අම්මට ගොඩාක් දුක හිතෙයි. තේරුණාද මගේ සුදු පුතේ."

කියමින් අම්මා හා පැංචාව සැනසුවා.

උපදෙස් දුන්නා.

ඒ හැම දේම අමතක කළ හා පැංචා දින කිහිපයක් ම ගං ඉවුර දෙසට ගියා.

දිනක් හා අම්මා මිදුල අතුගාමින් සිටින විට වසු පැටියා හති දාමින් ඇවිත්

“හා නැන්දේ .....හා නැන්දේ.....”

“ අනේ ඇයි පුතේ”

“හා පුංචා මල්ලි ගඟට වැටුණා”

“අනේ.....දෙයියනේ ....මගේ දරුවා”

හා අම්මාට ඉවසුම් නැති වුණා.

ඉදල පසෙකට විසි කරලා හා අම්මා පිම් දෙකට ගං ඉවුර දෙසට ගියා.

ගඟේ පහළටම දිව ගිය හා අම්මාට  දකින්න ලැබුණේ පොල් කොටයක් උඩ පා වෙන හා පැංචාව.



අනෙක් යාලුවෝ ලී කෑලී වතුරට දමමින් හා පැංචාව බේරා ගන්න උත්සහ කරනවා.

"අනේ මගේ සුදු පුතා බේර ගන්න කවුරුවත් නැද්ද" කියමින් හා අම්මා මුලු කැලයටම ඇහෙන්න කෑ ගැහුවා.

"අනේ අම්මේ මාව බේරගන්න. මට හරි බයයි."

හා පැංචාගේ ලතෝනිය ඒ අසල කැලේ සිටී අලි හාමිට ඇහුණා. අලි හාමි හනිකට ආවා. වෙලා තිබූ හදිය දැක්කා.

ගං ඉවුරට කිට්ටු වෙලා එයාගේ හොඬවැල හා පැංචා දෙසට දිගු කළා.

හා පැංචා හිමින් සැරේ හොඬවැලේ එල්ලුනා.

"පරෙස්සමට පුතේ" අලි හාමි කීවා.

අලි හාමි හොඬවැලෙන්ම උස්සලා හා පැංචාව හා අම්මාට දුන්නා.

"අනේ අම්මේ මට සමාවෙන්න. ඔයා කියපු දේ ඇහුවනම් අද මෙහෙම වෙන්නේ නෑ. ආයේ මම අම්මට අකීකරු වෙන්නේ නෑ. දරුවන්ට අනතුරක් වුනාම දෙමාපියයෝ කොච්චර දුක් වෙනවද කියල අද මම දැක්කා."

හා අම්මා කඳුලු පිරුණු දෑසින් පුතාව සිම්බා.

"බලන්න දරුවනේ මේ දේ ඔයාලා හැමෝටම හොඳ පාඩමක්. දෙමාපියන් කියන දෙයක් පිළිගන්න පුංචි දරුවෝ ඔයාලා හැම තිස්සෙම හිතට ගන්න ඕනී.

කියමින් අලි හාමි ලොකු උපදෙස් ටිකක් හැමෝටම දුන්නා.



"බොහෝම ස්තූතියි අලි මාමේ."

හා පැංචා අලි හාමිට ස්තූති  කළා.

හා අම්මත් අනෙක් හැමෝමත් අලි හාමිට ස්තූති කළා.

හා පැංචා එක පිම්මට ගෙදරට දිව ගියා.

# පසුවදන



අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකරවීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල් නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස්වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූතිවන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN : 978-624-208-993-5